# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 නොවැම්බර් - 2023 ජනවාරි

## මානවශාස්ත්‍ර පීඨය

## ක්‍රිස්තියානි සංස්කෘතිය (පැරණි නිර්දේශය)

## ක්‍රිස්තියානි ධර්මයේ වර්ධනය CHCU– E 3025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. 'හිප්පෝ නුවර අගොස්තීනුගේ චින්තනය අවබෝධ කරගත හැකි වන්නේ එම වකවානුවේ පැවැති භේදභේද දෙකක් වන ඩොනටියානුවාදය සහ පෙලාගියානුවාදයට එරෙහිව ගත් ස්ථාවරයන් අධ්‍යයනය කිරීමෙනි.' මෙය පැහැදිලි කරන්න.

02. මාටින් ලූතර්ගේ දේව ධර්මයේ මූලික ලක්ෂණ ඔහුගේ කෘති ඇසුරෙන් සාකච්ඡා කරන්න.

03. තෝමස් ඇක්වයිනස් විසින් දෙවිඳුන්ගේ පැවැත්ම සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ පස් වැදෑරුම් තර්ක සවිස්තරාත්මකව විමර්ශනය කරන්න.

04. ජෝන් හෙන්රි නිව්මන්ගේ ජීවිතයේ මුල් තීරණාත්මක අවස්ථාවක් ලෙස ඔක්ස්ෆර්ඩ් ප්‍රගමනයත් ඔහුගේ ධර්මයේ වර්ධනය පිළිබඳ නිබන්ධයත් පහදන්න.

05. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමෙන්ට් හා ඔරිගන්ගේ චින්තනයන් පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක් කරන්න.

06. ෆෙඩ්රික් ෂ්ලයමකර් නැමැති චින්තකයා භක්තිවාදයේ ආභාසය ලද ආකාරය පහදමින් රචනයක් ලියන්න.

07. තෙයියාඩ් ද ෂාදැන්ගේ ජීවන තොරතුරු පිළිබඳව කෙටි හැඳින්වීමක් කර ඔහු ඉදිරිපත් කළ ඔමේගා අවස්ථාව (Omega Point) පැහැදිලි කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ සවිස්තරාත්මක සටහන් ලියන්න.

- අ. ටර්ටූලියන්
- ආ. ලියොන්ස්හි අයිරේනියස්
- ඇ. කාල් රානර්
- ඈ. කාල් බාත්
- ඉ. පෝල් ටිලිච්

******************************